උරුමය උල්පත් 20

අතිපූජ්‍ය අකුරැටියේ නන්ද හිමිපාණෝ

***ප්‍රශ්නය : අවසරයි ස්වාමින්වහන්ස, විද්‍යෝදය පිරිවෙනේ ඉතිහාසය පිළිබඳ කෙටියෙන් කරුණු සඳහන් කළොත්?***

පිළිතුර : 1873 වර්ෂයේදී කොළඹ මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ආරම්භ කරනු ලැබුවා. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් යටතේ සිංහල භාෂා ප්‍රේමීන්, ආගම්වාදින් සියලු දෙනාම නිදහස පිළිබඳ සටනට එකතු වී සිටියා. නමුත් මේ හැම දෙනාටම එකතු විය හැකි පොදු ස්ථානයක් කොළඹ නගරය තුළ තිබුණේ නැහැ. ඒ අවස්ථාවේදී රත්මලානේ පරම ධම්මචේතිය පිරිවෙනේ වැඩ සිටි හික්කඩුවේ සිරි සුමංගල නායක හිමිපාණන් වහන්සේ 1872 වර්ෂයේදී කොළඹට වැඩම කොට 1873 වර්ෂයේ දී වස් විසීමෙන් පසුව විද්‍යෝදය පිරිවෙන ආරම්භ කළා.

එයින් වසර දෙකකට පසු විද්‍යාලංකාර පිරිවෙන ආරම්භ වුණා. මේ පිරිවෙන් ආරම්භ වීමත් සමග වැලිවිට අසරණ සරණ සංඝරාජයාණන් වහන්සේ විසින් නැති වී ගිය ශාස්ත්‍රප්‍රදීපය නැවත කොළඹ නරගයට, පහත රට ප්‍රදේශයට රැගෙන ඒමට කටයුතු කළා. උඩරට නියමකන්ද විද්‍යාස්ථානයෙන් ආරම්භ වූ එම උඩරට ප්‍රදේශයේ අධ්‍යාපනික තත්ත්වය වර්ධනය වීම ක්‍රමයෙන් පහත රටට පැමිණියා. රත්මලානේ පරමධම්මචේතිය පිරිවෙනේ ඉගෙන ගත් හික්කඩුවේ සුමංගල හිමිපාණන් වහන්සේ හා රත්මලානේ ධම්මාලෝක නායක ස්වාමින් වහන්සේ මේ පිරිවෙන් දෙක ආරම්භ කරන්නට මුල් වී ක්‍රියා කළා. ඉන් පසු මේ පිරිවෙන්හි ශාඛා ලෙස අද පිරිවෙන් 660 ක් පමණ ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්තව තිබෙනවා. මේ සියල්ලම විද්‍යාලංකාර පිරිවෙන හෝ විද්‍යොාදය පිරිවෙන ශාඛා ලෙස ක්‍රියාත්මක වෙනවා. අපි දැනට ඉතිහාසය ලියාගෙන යනවා. විද්‍යෝදය පිරිවෙන පමණක් ශාඛා 360 ක් පමණ දිවයින පුරා පිහිටුවා තිබෙනවා.

හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක හාමුදුරුවෝ, මහගොඩ ඥාණේස්වර නායක හාමුදුරුවෝ, කහවේ රතනසාර හාමුදුරුවෝ, බද්දේගම පියරතන නායක හාමුදුරුවෝ, වැලිවිටියේ සෝරත නායක හාමුදුරුවෝ, කරුකුදුයායේ පඤ්ඤාසේකර නායක හාමුදුරුවෝ, පනංගල ජිනරතන නායක හාමුදුරුවෝ විද්‍යෝදය පරිවේණාධිපතීන් වහන්සේලා වශයෙන් කටයුතු කළා. වර්තමාන පරිවේණාධිතීන් වහන්සේ වන අකුරැටියේ අමරවංශ නායක හිමිපාණන් 1977 සිට අවුරුදු 28 ක් විද්‍යෝදය පිරිවෙනේ පරිවේණාධිපති වහන්සේ වශයෙන් අනුපමේය සේවාවක් සිදු කටයුතු කරනවා.

මේ පිරිවෙන ආරම්භ කිරීමත් සමඟම ජාතික සටනේ පංච මහා වාදය වැනි වාද සඳහා එකතු වූ සටන් කාමීන්ට නිදහස ලබා ගැනීමේදී අවශ්‍ය මූලික කටයුතු කිරීමට මධ්‍යස්ථානයක් බවට පත් වුන බව කිව යුතුය.

*ප්‍රශ්නය : අද පිරිවෙන් අධ්‍යාපනයට තිබෙන විශාලම අභියෝගය කුමක්ද?*

පිළිතුර : අද පිරිවෙන් අධ්‍යාපනය එක්තරා ආකාරයේ අතරමං වූ අධ්‍යාපනයක් බවට පත් වී තිබෙනවා. බොහෝ පොඩි හාමුදුරුවරු පාසල් අධ්‍යාපනයේ 5 , 6 ශ්‍රේණි වලදී පාසල් අධ්‍යාපනය අත්හරිනවා. අපි පිරිවෙන් අධ්‍යාපනයේ මුලික වසර ලෙස සලකන්නේ පාසල් අධ්‍යාපනයේ 6 වන ශ්‍රේණියයි. අපි සාමණේර භික්ෂූන් වහන්සේලාට විශාල විෂයයන් සංඛාවක් උගන්වනවා. සිංහල, පාලි, සංස්කෘත, ඉංග්‍රීසි, දෙමළ, ගණිතය, ඉතිහාසය, සාමජ අධ්‍යයනය, ප්‍රජාචාරය, භූගෝලය ආදි විශාල සංඛ්‍යාවක් උගන්වනවා. දවසකට කාලපරිච්ජේද අටක් පමණ තිබෙනවා. මේ මුළු කාලපරිච්ජේද ප්‍රමාණය භාවිතා කළත් උන් වහන්සේලාට ඔරොත්තු නොදෙන තරමට මෙහි බර ප්‍රමාණය වැඩියි. පාසල් අධ්‍යාපනය ලෙස මෙහි විධිමත් බවක් නැහැ. මේ වන විට පිරිවෙන් අධ්‍යාපනයේ මුඛ්‍ය පරමාර්ථය කුමක්ද කියා නිශ්චයක් නැහැ. පාසල් අධ්‍යාපනය තුළ ප්‍රාථමික අධ්‍යාපනය, පශ්චාත් ප්‍රාථමික අධ්‍යාපනය, ද්විතික අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය, විශ්ව විද්‍යාල අධ්‍යාපනය වශයෙන් යනුවෙන් විධිමත් බවක්

තිබෙනවා. නමුත් භික්ෂූන් වහන්සේලාගේ අධ්‍යාපනය ශ්‍රේණිගත ක්‍රමයෙන් ආරම්භ වුවත් අවසානය පැහැදිලි නැහැ.

නමුත් විද්‍යෝදය පිරිවෙනේ අපටම ආවේණික වූ අධ්‍යාපන ක්‍රමයක් තිබෙනවා. අපේ වර්ග (ශ්‍රේණි) පටිපාටියෙන් අවුරුදු 8 ක් අවසන් වූ පසු විද්‍යෝදය පිරිවෙනේ අවසන් සාමාර්ථය ලබා ගන්න පුළුවන්. ඒ සාමාර්ථය ලබන භික්ෂූන් වහන්සේට වෙනත් පංතියකට නොගොස් පිරිවෙනෙන් ලබා ගත් අධ්‍යාපනය තුළින් ප්‍රාචීන භාෂෝපාකාර සමාගමෙන් පවත්වන ප්‍රාචීණ ප්‍රාරම්භ, මධ්‍යම, අවසාන යන විභාග තුනටම පෙනී සිට ප්‍රාචීණ පඬිවරයෙකු වීමට අවස්ථාව ලැබෙනවා. උන්වහන්සේලාට විශ්ව විද්‍යාලයකට ගොස් උපාධි පාඨමාලාවක් හැදෑරීමට ද අවස්ථාව තිබෙනවා. නමුත් මෙවැනි අධ්‍යාපන ක්‍රමයක් තිබෙනවානම් අද රටේ මේ ආකාරයේ ගැටළු අතිවන්නේ කෙසේද කියා අද මුළු ලෝකයම ප්‍රශ්න කරනවා. අපේ ධර්මය, සාරධර්ම පිළිබඳව අපි නිසි ආකාරයෙන් සොයා බලා එයින් ගත හැකි විසඳුම් අපේ සමාජයට ලබා ගෙන නැති බව මෙයින් පෙනී යන කාරණයක්. බෞද්ධ සමාජයේ තිබෙන මූලික පෙළ හොඳින් අධ්‍යයනය කර එහි තිබෙන සාරධර්ම උකහාගෙන ඒවා අපේ ජීවිතයට අත්හදා බැලිය යුතුයි. අද ජාත්‍යන්තරයට මේ ධර්මය ප්‍රකාශ කිරීමට නම් විද්‍යාව සමඟ එකතු වීම අත්‍යාවශයි. තුලනාත්මක ආගම් අධ්‍යනය අද තිබෙන එක ප්‍රශ්නයක්. අද කොළඹ සිටින ජනගහණයෙන් සිංහලයන් සිටින්නේ තුනෙන් එකක් පමණය. ඒ නිසා අප මහා ජාතිය වුවත් වටපිටාව ගැන කල්පනා කළ යුතුයි. ඒ ආගම් පිළිබඳවත් සිතිය යුතුයි. ජේසුස් වහන්සේ, මහමද්තුමා, හින්දු ආගමේ බ්‍රහ්මන් ගැන පිළිබඳව කථා කරන්න කියලා අපිට අවශ්‍ය වුවහොත් අපිට ඒ පිළිබඳ දැනුමක් නැහැ. නමුත් කතෝලික, ක්‍රිස්තියානි පූජකවරු ඔවුන්ගේ ආගමට වඩා බුද්ධාගම පිළිබඳ ඉගෙන ගන්නවා. බුදු දහම හිතේ තබා ගෙන කතෝලික ආගම පිළිබඳව ප්‍රකාශ කරනවා. මේ අය අපේ දේවල් හොරා ගන්නවා කියා අපි සටන් කරනවා. නමුත් සැබවින්ම ඔවුන් කරන්නේ අපි කළ යුතු දෙයයි. ඒ නිසා අපේ දහම් අධ්‍යාපනය පිළිබඳව ගැඹුරින් සොයා බලා කර සකස් විය යුතුයි.

*ප්‍රශ්නය : ඔබ වහන්සේ දකින අන්දමට මේ ප්‍රතිසංස්කරණය සඳහා නායකත්වය ලබා දිය යුත්තේ කවුද? මෙය කළ යුත්තේ කෙසේද?*

පිළිතුර : විශේෂයෙන් රජය මෙයට මූලිකත්වය ලබා දිය යුතුය. පිරිවෙන් අධ්‍යාපන ක්‍රමය සඳහා පනත් කිහිපයක් ඇති කළා. ඒවායින් මූලික වශයෙන් කළේ ආචාර්ය වරුන්ගේ වෘත්තීය අයිතීන් ආරක්‍ෂා කිරීමයි. ශිෂ්‍යයන්ගේ පැත්තෙන් තිබෙන දුෂ්කරතා පිළිබඳව අධ්‍යයනයක් කර ඒ ප්‍රශ්න පිළිබඳ අවධානය යොමු කළේ නැහැ. පොඩි හාමුදුරුවන්ගේ ගැටළු මොනවාද කියා මා දන්නේත් නැහැ. ඒ නිසා එවැනි අධ්‍යයනයක්, ඇහුම්කම් දීමක් කළ යුතුයි. මේ අධ්‍යාපන රටාව නවීන ලෝකයට ගැලපෙන ආකාරට තුලනාත්මක ආගම් අධ්‍යයනය ඇතිව, 21 වන සියවසට මුහුණ දිය යුතුයි. ඉස්සර ධර්ම දේශනා කරන විට වාක්‍යයක් වාක්‍යයක් පාසා 'එහෙමයි ස්වාමිනි, එහෙයි ස්වාමිනි' යනුවෙන් ප්‍රකාශ කරනවා. නමුත් අද තරුණයෙක් සමඟ කතා කළහොත් ඒ ස්වරූපය දකින්නට නෑ. 'ඇයි එහෙම කියන්නේ ස්වාමින් වහන්ස' කියා ප්‍රශ්න කරන්න පුළුවන්. එවැනි තත්ත්වයක් යටතේ ශ්‍රාවකයාට වඩා දැනුමෙන් අපි පෝෂණය විය යුතුයි. විදේශිකයන් ථෙරවාදි බුදු දහම පිළිබඳ දැන ගන්න, පර්යේෂණ කරන්න, සොයා බලන්න ලංකාවට එනවා. ඒ අයට අවශ්‍ය දැනුම දෙන්න නම් අපි එයට වඩා දැනුමෙන් පොහොසත් වීම අවශ්‍යයි.

*ප්‍රශ්නය : මේ සඳහා රජය මැදිහත් වී පැහැදිලි නායකත්වයක් ලබා දිය යුතුයි කියන කරුණ අවවාදාත්මකයි. මෙයට ශාසනික පැත්තෙන් කරන්න පුළුවන් කුමක්ද?*

පිළිතුර : එක්තරා ආකාරයක ස්වයං විවේචනයක් කළ යුතුයි. ඉතිහාසයේ බුදුරජාණන් වහන්සේ සිටියා. ශ්‍රාවකයන් පැවිදි වූයේ සසර කළ කිරුණු නිසයි. ඒ නිසා ධර්මය සඳහා නායකත්වයක් පත් කිරීමක් අවශ්‍ය තිබුණේ නැහැ. සියලු දෙනාම වගේ එක පරමාර්ථයක සිටියා. නමුත් අපි දැන් අපි ගැන මෙන්ම අපේ අසල් වැසියා ගැනත් සිතිය යුතුයි. ලෝකයේ ආගමික සංවිධානය වල ව්‍යුහය පිළිබඳ කතා කරන විට එකතු වු සංවිධානය තිබෙනවා. ඒකාන්තයෙන්ම මහ

නායක මාහිමි පාණන් වහන්සේලාගෙන් සැදුම් ලත් ස්වාධීන මණ්ඩලයක් තිබිය යුතුයි යන්න මාගේ පෞද්ගලික අදහසයි.

***ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, ශාසනික මට්ටමෙන් දැනට කරනු ලබන ප්‍රතිසංස්කරණ මොනවාද?***

පිළිතුර : පසුගිය කාලාන්තරය පුරාම භික්ෂූන් වහන්සේලා උසාවි වලට යනවා. නොයෙක් නඩු හබ වලට පැටලෙනවා. පුවත්පත් බැලුවත් ඒවායේ ඉතාමත් බාල ව්‍යාපාරික දැන්වීම් දකින්නට ලැබෙනවා. මේවා දැක්කාම ගිහියන් මෙන්ම වැඩිහිටි හාමුදුරුවරුත් බොහෝම කණගාටුවට, කනස්සල්ලට පත් වෙනවා. මේ දේවල් නතර කරන්න සෑහෙන්න උත්සාහ කරනවා. නමුත් ප්‍රතිඵල අඩුයි. 2550 වන බුද්ධ ජයන්තියෙන් පසුව ශ්‍යාමෝපාලි මහා නිකායේ වර්තමාන මහ නායක තිබ්බටුවාවේ ශ්‍රී සුමංගල හාමුදුරුවෝ භික්ෂූන් වහන්සේලා සඳහා කතිකාවතක් සම්පාදනය කර, සංඝාධිකරණයක් හඳුන්වා දී, එය නීති ගත කරන්න උත්සාහයක් දැරුවා. පසුගිය මාස දෙක තුළ මල්වතු විහාරයේදී විශේෂඥ පිරිසක් රැස් වී මේ කතිකාවතත්, සංඝාධිකරණයත් සම්පාදනය කරන්න යෙදුණා. දැන් එය අස්ගිරි විහාරයට භාර දී තිබෙනවා. සියම් නිකායේ සියලුම පාර්ශව වලට මෙය ලබා දී උන්වහන්සේලාගේ අදහස් ගෙන සංශෝධන ඇත්නම් ඒවා සිදු කර අමරපුර, රාමඤ්ඤ නිකාය දෙකටත් අදහස් ඉදිරිපත් කර අපි හැමෝටම පොදු සංඝාධිකරණයක්, කතිකාවතක් සම්පාදනය කර මේ ගැටළු අවම කර ගැනීමට ක්‍රියා කරනවා. අපේ ඉතිහාසයේ පොලොන්නරු, දඹදෙණි, මහනුවර ආදි කතිකාවත් තිබෙනවා. ශාසනය වැටුණු නොයෙකුත් අවස්ථා වලදී ශාසනයේ පුනර්ජීවනයක් ඇති කරන්න ක්‍රියා කොට තිබෙනවා. මේ සියල්ලටම මුල් වුණේ රජය. අපට බුදුදහම ලැබුණොත් ධර්මාශෝක අධිරාජ්‍යයා කළ තෙවැනි ධර්ම සංගායනාවෙන් පසුවයි. අපේ රටේත් රාජකීය මැදිහත් වීමෙන් පොලොන්නරු කතිකාවත ආරම්භ කොට දුෂ්ශීල මහණුන් නෙරපා හැර සංගායනාවක් පැවැත්වූවා. දැන් තිබෙන ප්‍රජාතන්ත්‍රවාදි පක්ෂ දේශපාලන තත්ත්වය අනුව එසේ කටයුතු කිරීම දුෂ්කර වුවත් ශාසනික වශයෙන් පක්ෂ,

විපක්ෂ කාගේත් අදහස් වල වෙනස් නැති බව මාගේ අදහසයි. ඒ නිසා ඒ කටයුත්ත කිරීමට හැකි බව මා විශ්වාස කරනවා.

*ප්‍රශ්නය : මේ වැඩපිළිවෙල සඳහා නායකත්වය ලබා දුන් ඔබ වහන්සේලාගේ සැලසුම් පිළිබඳව සඳහනක් කළොත් ස්වාමින් වහන්ස?*

පිළිතුර : ඇත්ත වශයෙන්ම මල්වත්තේ මහා නායක හාමුදුරුවෝ මේ සඳහා ප්‍රජාතන්ත්‍රවාදි සහ නම්‍යශීලි ඉදිරි පියවරක් තැබුවා. උන් වහන්සේ එක් තැනක පමණක් වැඩ නොසිට රටපුරා නොයෙක් ප්‍රදේශ වලට වැඩම කොට, විහාරස්ථාන වලට ගොස් භික්ෂූන් වහන්සේලා හමුවෙලා උන්වහන්සේලා සමඟ සාකච්ඡා කොට උන්වහන්සේලාගේ අදහස් සඳහා එක්තරා සහයෝගයක් ලබා දුන්නා. මීට පෙර තිබුණේ මෙයට වෙනස් තත්ත්වයක්. එහිදි අපි පුද පූජා රැගෙන ගොස් හමුවී කතා කර තමන්ගේ ප්‍රශ්න ඉදිරිපත් කළ යුතු තත්ත්වයක් තමයි තිබුණේ. උන්වහන්සේ රට පුරා විසිරී සිටින උගත් භික්ෂූන් වහන්සේලා දහනමක් කැඳවා දවස් තුනත් එහි නැවතී සිට අපි එකතු වෙලා මුල් කොටස සම්පාදනය කළා. ඊළඟ මාසයේ එහි නැවතී සිට ඉතිරි කොටස සම්පාදනය කළා. දැන් අපි එය මුද්‍රිත තත්ත්වය පත් කර භාර දුන්නා. මේ සඳහා මහා නායක හිමියන්ගේ තිබූ නැම්යාව දුටු විට අනික් භික්ෂූන් වහන්සේලාත් උදව් කළා.

*ප්‍රශ්නය : තායිලන්තයේ මේ ආකාරයේ පසුබිමක් තිබෙනවා. මෙය නිර්මාණයේදී තායිලන්තය දෙසත් බැලුවාද? නැති නම් මෙය අපේම දෙයක්ද?*

පිළිතුර : මෙය අපේම දෙයක්. අපේ පැරැණි සම්ප්‍රදායේ තිබුණ කතිකාවත් අපි යාවත්කාලීන කළා. බුද්ධාගමේ භික්ෂූන් වහන්සේ කෙනෙක්ට පැවිද්ද ලබා දුන්නාට සිවුරෙන් ඉවත් කිරීමේ බලයක් ආවේණිකව නැහැ. මේ සඳහා නොයෙක් තර්ක ඉදිරිපත් වෙනවා. රාජ්‍ය සේවා කොමිසම රාජ්‍ය සේවයට සේවකයෙක් බඳවා ගන්නා විට, ඒ සේවකයා ඉවත් කිරීමේ බලය ද රාජ්‍ය සේවා කොමිසමට තිබෙනවා. පැවිද්ද දෙන භික්ෂූන් වහන්සේ නොසුදුසු නම් ඉවත් කිරීමේ බලතලත්

ලබා දිය යුතුයි. අද එක් නිකායකින් භික්ෂුවක් ඉවත් කළහොත් වෙනත් නිකායකින් ඒ භික්ෂුව භාර ගන්නවා. ඒ නිසා අද අන්තර් නිකායික සම්බන්ධතාවයක් අවශ්‍යයි. මෙවැනි වැරැදි වලදී පොදු එකඟතාවයක් තිබිය යුතුයි. අපි අතර සම්මතයක් ඇති කර ගත යුතුයි. ඒ ඒ වැරදි සඳහා නියමිත දඬුවම් ලබා දිය යුතුයි. මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න නීතිවේදීන්ගේ උපදෙස් බලාපොරොත්තුවෙන් සිටිනවා. ඉදිරි මාස කිහිපය තුළදී මෙය අවසන් කරන්න හැකියාව තිබෙනවා. ඉන්පසු කතිකාවත් සංඝාධිකරණයේදී සම්මත කිරීමේ පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු බෞද්ධ කොමසාරිස් විසින් මේ කතිකාවත් ගැසට් කළ විට ඒවා නීති ගත වෙනවා.

***ප්‍රශ්නය : අද සමාජය තුළ බොහෝ දෙනෙක් බුද්ධාගම අදහන්නේ මතු පිටින් පමණයි. එය පදක්කමක් ආකාරයෙන් පැළඳගෙන යනවා මිසක් එය හදවතට අරගෙන තිබෙනවා ප්‍රමාණවත් නැහැ. මෙයට හේතුව කුමක්ද? මේ ආකල්පය වෙනස් කරන්නේ කොහොමද?***

පිළිතුර : ගුණ යහපත් පිරිස පිළිබඳව සමාජයේ තිබෙන ඇගයුම මීට වඩා වැඩි විය යුතුයි. පන්සිල් රකින පුද්ගලයා විශ්වාසනීය පුද්ගලයෙක් බවට පත් වෙනවා. නමුත් අද අපි විශ්වාසනීය පුද්ගලයන් කියන්නේ එවැනි අයට නොවේ. අපි එවැනි පුද්ගලයන් හඳුන්වන්නේ ධනය හා තනතුර පදනම් කොට ගෙනයි. බොරු නොකියන පුද්ගලයන් අපි අගය කළ යුතුයි. නමුත් අද සමාජයේ එවැනි දෙයක් සිදු වන්නේ නැහැ. ඡන්දයකදී වැඩියෙන්ම ඡන්දය ලබා බලයට පත් වන්නේ වැඩියෙන්ම බොරු කියන පුද්ගලයින් වෙන්න පුළුවන්.

සාරධර්ම අධ්‍යයනය පාසල තුළින්ම ආරම්භ විය යුතුය. මෙය සමාජයට ගෙනියන්න තිබෙන හොඳ මාර්ගය පාසල් අධ්‍යාපනයයි. ඔබතුමාට මතක ඇති කුඩා කාලයේ අධ්‍යාපනය හැදෑරූ ආකාරය. එහිදී සිංහල, දෙමළ, මුස්ලිම් යන සියලු දෙනාම ඉගෙන ගත්තේ එකට. එසේ ඉගෙන ගත් අය තවමත් මිත්‍රයන් වගේ සිටිනවා. විශ්ව විද්‍යාලයේදී හමුවන සිංහල දෙමළ අය ප්‍රේම සම්බන්ධතා ඇති කරගෙන බොහෝම හොඳට තමාගේ විවාහ ජීවිත ගත කරනවා.

අධ්‍යාපනය තුළින් ඒ සමානතාවය ආරක්ෂා වුණා. අධ්‍යාපනය තුළදී එසේ වෙනසක් තිබුණේ නැහැ. ඒ නිසා ''පාසල'' මේ ජාතික ප්‍රශ්නය විසඳීමට හොඳම ස්ථානයයි. මීට අවුරුදු පනහකට පමණ පෙර භාෂාව බාධකයක් වුණේ නැහැ. ඒ නිසා ඔවුන්ගේ සංස්කෘතීන් හඳුනා ගන්න හැකියාව තිබුණා. නමුත් අද එවැනි තත්ත්වයක් නැහැ. ඒ නිසා රටේ තිබෙන ප්‍රාදේශික භාෂා පිළිබඳ දැනීම අද ඉතා අත්‍යාවශ්‍ය දෙයක්.

***ප්‍රශ්නය : මෙහි ආරම්භය විය යුත්තේ පාසල් අධ්‍යාපනය තුළින් බව පැහැදිලියි. ඒ වගේම මාධ්‍යයටද මෙහි වගකීමක් තිබෙනවා නේද?***

පිළිතුර : අද ජන මාධ්‍යයට විශාල වගකීමක් තිබෙනවා. නමුත් අද මාධ්‍ය වල විශාල තරගකාරීත්වයක් තිබෙනවා. ඒ නිසා ඔවුන් තරගකාරීව ප්‍රවෘත්ති සපයන්න, යම් යම් අදහස් ඉදිරිපත් කරන්න කටයුතු කරනවා. මෙහිදී සදාචාර විරෝධී දේ ඉදිරිපත් වෙන්න පුළුවන්. අද බොහෝ ආරණ්‍ය පවා අනවශ්‍ය ලෙස ජනප්‍රිය වෙන්න ගොස් ඔවුන්ගේ අපේක්ෂිත අරමුණු වලින් බැහැරව ක්‍රියා කරනවා. කෙසේ නමුත් අද මාධ්‍යයට සදාචාරය පිළිබඳ විශලා වගකීමක් තිබෙනවා. අද අපේ රටේ තිබෙන මාධ්‍ය නිදහස යුරෝපා රට වලවත් තිබෙනවාද කියා සැක සහිතයි. ඒ රටවල සියල්ලන්ටම එකට සිට නැරඹිය හැකි බොහෝ හොඳ වැඩසටහන් ඉදිරිපත් කරනවා. අද අපේ රටේ නරකයි කියා පැත්තකට දැමිය හැකි මාධ්‍යක් නැතිවා සේම හොඳයි කියා කියන්න එකක් ද නැහැ. සිංහල භාෂාව නැත්තටම නැති වන ආකාරයෙන් ක්‍රියා කරන්න සමහර මාධ්‍ය කටයුතු කරනවා.

***ප්‍රශ්නය : ඔබ වහන්සේ ප්‍රකාශ කරන දේ පැති දෙකකින් කළ යුතු බව මාගේ හැඟීමයි. මේ සඳහා බලපාන ප්‍රමිති රජය මගින් ඉදිරිපත් කළ යුතුයි. එවගේම ස්වාමින් වහන්සේලා හා ගිහි සමාජය මේ සඳහා බලපෑම් කළ යුතුයි. බටහිර ලෝකයේ ජනාධිපතිවරුන්ගේ භාර්යාවන් මෙවැනි දේවල් සඳහා නායකත්වය ගන්නවා. ඒ සඳහා තිබිය යුතු ප්‍රමිති ඉදිරිපත් කරනවා. එහිදී එතුමිය***

***නායකත්වය ලබා දී මෙවැනි දේවල් නැවැත්වීමට කටයුතු කරනවා. නමුත් එවැනි බලපෑමක් අපේ සමාජයෙන් ඇති වෙනවා කියා පෙනෙන්නේ නැහැ.***

පිළිතුර : එය නිවැරදියි. අද සමාජයත් නොමඟට ගමන් කරන අවස්ථාව වැඩියි. බොරුවට මුහුණු ගොඩයි කිව්වා වගේම බොල් දේවල් සඳහා ප්‍රමුඛතාවය ලැබෙනවා වැඩියි. ඒ නිසා බහුතරය යන්නේ ඒ පැත්තටයි. ඒ නිසා අද සමාජයේ දැන උගත් පිරිස, වැඩිහිටියන් බොහෝ කනස්සල්ලට පත්වී සිටිනවා. අපේ රටේ පාරිභෝගික අයිතිය පිළිබඳව කටයුතු කරන්නේ නැහැ. කෑම, බීම වල තිබෙන ප්‍රමිතිය, තත්ත්වය පිළිබඳව අපි සෑහීමකට පත් විය යුතුයි. අපේ දුරකථන බිල නිසි වේලාවට නොගෙවූ විට එය විසන්ධි කරනවා. නමුත් අපේ පාරිභෝගික අයිතීන් පිළිබඳව කථා කරන්නේ නැහැ. ජන මාධ්‍ය මගින් යම් වරදක් සිදු වූ විට ජනතාව එය විරුද්ධව නැගී සිටිය යුතුයි. උද්ඝෝෂණ කළ යුතුයි.

***ප්‍රශ්නය : මේ සඳහා නායකත්වය ලබා දිය හැක්කේ කෙසේද? වෙනත් රට වල සමාජ ආයතන වලින් ඒ ඒ වැඩසටහන් වර්ගීකරණය කර ජනතාවට ලබා දෙනවා.***

පිළිතුර : රූපවාහිනී ආයතන වලට මේ පිළිබඳව සංවාද පැවැත්වීමට අවස්ථාව තිබෙනවා. කාලතුරකින් සමහර නාලිකා වල එවැනි වැඩසටහන් පවත්වනවා. ගුවන් විදුලියේ ශ්‍රවණ පරියේෂණ අංශයක් තිබුණා. ඒ නිසා ශ්‍රවණ දෘෂ්‍ය පරියේෂණ අංශයක් හැම නාලිකාවකම ඇති කළ යුතුයි.

***ප්‍රශ්නය : ඔබ වහන්සේගේ අදහස අනුව මේ සමාජයේ එක වෙනසක් ඇති කළ යුතු කරුණක් ඇත්නම් එය කුමක්ද?***

පිළිතුර : අපේ රටේ බොහෝ ප්‍රශ්න ඇති වුණේ දුප්පත්කම නිසා යැයි කියා බොහෝ දෙනා හිතනවා. දිළිඳුකම දුකක් ලෙස බුදුරජාණන් වහන්සේ පවා පෙන්වා දී තිබෙනවා. මේ දුප්පත්කම නිසා බොහෝ වටිනකම් නැති වෙනවා. අපරාධ වැඩි වෙනවා. ඒ නිසා දුප්පත්කම තුරන් කර හොඳ රැකියාවක් ඇතිව,

හොඳින් තම දරුවන්ට උගන්වා, තමන්ගේ කියා ගෙයක් දොරක් හදා ගෙන සිටින සමාජයක, සමාජ අසාධාරණකම් අඩු වෙනවා. බුදු දහම අගය කරන්නේ එවැනි සමූපකාර ජීවිතයක්.

නමුත් නිදහසින් පසුව අපේ රටේ එවැනි සෞභ්‍යාගයක් වෙත යන තත්ත්වයක් උදා වෙලා නැහැ. රටට පත් වෙන ඕනෑම නායකයෙකුගේ පළමු යුතුකම විය යුත්තේ ජනතාවට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය කර දීමයි. ඒ නිසා ජනතා ප්‍රශ්න දිගු කාලීනව විසඳිය හැකි නායකයෙකු සොයා ගැනීම සිදු කළ යුතුයි. අවුරුදු දෙක තුනක සැලැස්මකින් මේ දෙය කළ නොහැකියි.

***බොහෝම ස්තූතියි ස්වාමින් වහන්ස.***